# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2142/90 - 2019 සැප්තැම්බර් මස 27 වැනි සිකුරාදා - 2019.09.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 17/2014

**(128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනත**

(128 වන අධිකාරය වූ) කර්මාන්ත ශාලා ආඥාපනතේ 3 වන වගන්තිය සමඟ කියවිය යුතු, එකී ආඥාපනතේ 105 වන වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදනු ලැබ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝග.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2019 අංක 1 දරන කර්මාන්තශාලා (කර්මාන්තශාලා ලියාපදිංචි කිරීමේ සහ කර්මාන්තශාලා ගොඩනැගිලි සඳහා අනුමතය ලබාදීමේ) නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. (1) යම් කර්මාන්තශාලාවක් මේ නියෝගවල විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි කර ඇත්තේ නම් මිස, කිසිම තැනැත්තෙකු එම කර්මාන්තශාලාවේ අයිතිකරු හෝ පදිංචිකරු නොවිය යුතු ය.

(2) කිසිම තැනැත්තෙකු අවස්ථාවෝචිත පරිදි යම් ඉදිකිරීම් භූමි භාගයක යම් කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරීම, ගොඩනැගිල්ල විශාල කිරීම හෝ වෙනස් කිරීම සඳහා වන පිඹුරුපත්, අවස්ථාවෝචිත පරිදි, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින් අනුමත කර ඇත්තේ නම් මිස,

(අ) යම් ඉදිකිරීම් භූමි භාගයක කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරීම ; හෝ
(ආ) යම් කර්මාන්තශාලා ගොඩනැගිල්ලක යම් විශාල කිරීමක් හෝ වෙනස් කිරීමක් සිදුකිරීම ; හෝ
(ඇ) වෙනත් යම් ගොඩනැගිල්ලක් කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් බවට පරිවර්තනය කිරීම හෝ.

ආරම්භ නොකළ යුතු ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. කර්මාන්තශාලාවක් ලියාපදිංචි කිරීම, කර්මාන්තශාලා ගොඩනැගිලි සහ එහි භූමිය සඳහා අනුමැතිය ලබා ගැනීම, යම් කර්මාන්තශාලා ගොඩනැගිල්ලක යම් විශාල කිරීමක් හෝ වෙනස් කිරීමක් සඳහා අනුමැතිය ලබාගැනීම හෝ වෙනත් යම් ගොඩනැගිල්ලක් කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් බවට පරිවර්තනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ද සමග, අවස්ථාවෝචිත පරිදි, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

4. (1) 3 වන නියෝගය යටතේ කර්මාන්තශාලාවක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ලැබුණු විට, අවස්ථාවෝචිත පරිදි, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින්, ඔහු එම කර්මාන්තශාලාව අවශ්‍ය නියමයන්ට අනුකූල බවට සෑහීමට පත් වන්නේ නම්, එම කර්මාන්තශාලාව තත්කාර්යය සඳහා පවත්වාගෙන යන රෙජිස්ටරයක ලියාපදිංචි කොට, මෙහි III වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතු ය.

(2) 3 වන නියෝගය යටතේ යම් කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් සහ ඉදිකිරීම් භූමි භාගයක් අනුමත කර ගැනීම සඳහා, යම් කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් විශාල කිරීම හෝ වෙනස් කිරීම අනුමත කර ගැනීම හෝ වෙනත් යම් ගොඩනැගිල්ලක් කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් බවට පරිවර්තනය කිරීම අනුමත කර ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, අවස්ථාවෝචිත පරිදි, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින්, එම කර්මාන්තශාලා ගොඩනැගිල්ල සහ එහි භූමිය, විශාල කිරීම, වෙනස් කිරීම හෝ පරිවර්තනය කිරීම අවශ්‍ය නියමවලට අනුකූල බවට සෑහීමට පත් වන්නේ නම් එම කර්මාන්තශාලා ගොඩනැගිල්ල සහ ඉදිකිරීම් භූමි භාගය සඳහා හෝ, විශාල කිරීම හෝ වෙනස් කිරීම හෝ පරිවර්තනය කිරීම සඳහා අනුමතය දීම සහ එම අනුමතය තත්කාර්යය සඳහා පවත්වාගෙන යන රෙජිස්ටරයක වාර්තා කිරීම කළ යුතු ය.

5. (1) මෙම නියෝග යටතේ දැනටමත් ලියාපදිංචි කොට ඇති යම් කර්මාන්තශාලාවක කරගෙන යන වැඩවල ස්වභාවයට යම් වෙනස්කම් සිදු කරනු ලබන අවස්ථාවක හෝ මෙම නියෝග යටතේ දැනටමත් ලියාපදිංචි කොට ඇති ගොඩනැගිල්ලකට යම් ව්‍යුහමය වෙනස්කම් සිදු කරනු ලබන අවස්ථාවක, එම කර්මාන්ත ශාලාවේ අයිතිකරු හෝ පදිංචිකරු එම කර්මාන්තශාලාව නැවත ලියාපදිංචි කිරීම සඳහා එම වෙනස්කම් සිදු කර මාස හයක කාලසීමාවක් ඇතුළත ඉල්ලුම් කළ යුතු ය.

(2) කර්මාන්තශාලාවක් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මෙම නියෝගවල ඉහතින් වූ විධිවිධාන මෙම නියෝගයේ (1) වන ඡේදය යටතේ වන යම් නැවත ලියාපදිංචි කිරීමකට, අවශ්‍ය වෙනස් කිරීම සහිතව, අදාළ විය යුතු ය.

6. (1) 4 වන නියෝගයේ (1) වන ඡේදය යටතේ පවත්වාගෙන යනු ලබන කර්මාන්තශාලා රෙජිස්ටරය, අවස්ථාවෝචිත පරිදි, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින් හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින්, ඒ සම්බන්ධයෙන් එම කර්මාන්තශාලාවේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් සංශෝධනයේ ස්වභාවය සහ ඒ සඳහා හේතු නිශ්චිතව දක්වමින් තමා වෙත යොමු කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මත සංශෝධනය කළ හැකිය.

(2) ලියාපදිංචි සහතිකයට යම් වෙනස්කම් සිදු කරනු ලබන අවස්ථාවක, එම වෙනස්කම සිදුකරන ලද දිනයේ සිට මාසයක් ඇතුළත දී එම වෙනස්කම සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයාට හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයාට දැනුම් දීම කර්මාන්තශාලාවේ අයිතිකරු හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය. යම් ලියාපදිංචි සහතිකයකට සිදු කරනු ලබන බලය නොලත් වෙනස් කිරීම් මගින් එම ලියාපදිංචි සහතිකය අවලංගු වන්නේ ය. එවැනි යම් අවස්ථාවක දී, ලියාපදිංචි සහතිකයට එසේ බලය නොලත් වෙනස්කමක් සිදු කිරීම සම්බන්ධයෙන් කර්මාන්තශාලාවේ අයිතිකරු හෝ පදිංචිකරු වගකීමට යටත් වන්නේ ය.

7. (1) 4 වන නියෝගයේ හෝ 5 වන නියෝගයේ (1) වන ඡේදය යටතේ වන සෑම ඉල්ලුම්පත්‍රයක් ම පහත සඳහන් ලේඛන සමග ඉදිරිපත් කළ යුතු ය :-

(අ) නිෂ්පාදන ක්‍රියාපටිපාටිය සම්බන්ධ ලුහුඬු විස්තරයක් ද සමග ඒ සම්බන්ධ ගැලීම් සටහනක් ;

(ආ) (i) යාබද ගොඩනැගිලි, සහ අනෙකුත් ව්‍යුහයන්, මාර්ග සහ කාණු ද ඇතුළු කර්මාන්තශාලා භූමි භාගය සහ එහි ආසන්නත ම වටපිටාව ;

(ii) ස්වභාවික ආලෝකකරණය සහ වාතාශ්‍රයට සම්බන්ධ සියලු අදාළ තොරතුරු දක්වමින්, සැලැස්මෙහි ආරෝහනය සහ එහි ආසන්නතම නොයෙකුත් ගොඩනැගිලිවල හරස්කඩක් ; සහ

(iii) ගිනි හෝ හදිසි අවස්ථාවක දී පිටවීමට ඇති විධාන ද සමග පිරියත සහ යන්ත්‍රෝපකරණවල සියලු කොටස් දක්වමින්, එම පිරියත සහ යන්ත්‍රෝපකරණවල පසුබිම දක්වමින්,

මිනුමට අඳින ලද පිටපත් දෙකකින් යුත් පිඹුරුපත්,

(ඇ) ආඥාපනතේ නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් විස්තර.

(2) අවස්ථාවෝචිත පරිදි, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින්, කර්මාන්තශාලා ආඥාපනතේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර ඇති බවට සෑහීමට පත්වීමෙන් පසු, ඔහු විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, I වන ඡේදයේ දක්වා ඇති ඉල්ලුම්පත්‍රය අනුමත කොට එම අනුමත කළ සැලසුමේ පිටපතක් ඉල්ලුම්කරු වෙත යැවිය යුතු ය. කර්මාන්තශාලා ආඥාපනතේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර ඇති බවට ඔහු සෑහීමට පත් නොවන අවස්ථාවක දී, වෙනත් යම් තොරතුරු කැඳවීම හෝ හේතු දක්වමින් ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීම හෝ ඔහු විසින් කළ හැකි ය.

8. (1) මෙම නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ලියාපදිංචි කොට ක්‍රියාත්මකව පවතින යම් කර්මාන්තශාලාවක අයිතිකරු හෝ පදිංචිකරු විසින් මෙම නියෝග ක්‍රියාත්මක වන දිනයේ සිට මාස හයකට පසු නොවන කාලයක් තුළ නැවත ලියාපදිංචි කිරීම සහ ගොඩනැගිලි සැලසුම් අනුමතය සඳහා ඉල්ලුම් කළ යුතු ය.

(2) මෙම නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී එවකටත් ක්‍රියාත්මකව පවතින සහ ලියාපදිංචි කර නොමැති යම් කර්මාන්තශාලාවක අයිතිකරු හෝ පදිංචිකරු මෙම නියෝග ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට මාස හයක කාලසීමාවක් ඇතුළත එම කර්මාන්තශාලාව ලියාපදිංචි කළ යුතු ය.

9. (1) 4 වන නියෝගය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය, එම සහතිකය නිකුත් කරනු ලබන දින සිට අවුරුදු තුනක කාලසීමාවක් සඳහා වලංගු වන්නේ ය. ලියාපදිංචි සහතිකයක් අලුත් කිරීම සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක් ම මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ද සමග දැනට පවතින ලියාපදිංචි සහතිකය ඉකුත් වීමට මාස හයකට පෙරාතුව, අවස්ථාවෝචිත පරිදි, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයාට හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයාට ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ ලියාපදිංචි සහතිකය අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, අවස්ථාවෝචිත පරිදි, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින් එම කර්මාන්තශාලාව අවශ්‍ය නියමවලට අනුකූල බවට සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් එම ලියාපදිංචි කිරීමේ සහතිකය, එම අලුත් කිරීමේ දින සිට ආරම්භව තවත් අවුරුදු තුනක කාලසීමාවක් සඳහා අලුත් කරනු ලැබිය යුතු ය.

10. කර්මාන්තශාලාවක් ලියාපදිංචි කිරීම සඳහා හෝ මේ නියෝග යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන කර්මාන්තශාලාවක යම් අයිතිකරුවෙකු හෝ පදිංචිකරුවකුගෙන් නියමිත දිනයට පසුව, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුවෙන් සියයට පහක අතිරේක ගාස්තුවක් ද අයකරනු ලැබිය යුතු ය.

11. මෙම නියෝගවල විධිවිධාන කඩ කරනු ලබන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන්නේ ය.

## I වන උපලේඛනය

(3 වන නියෝගය)

**කර්මාන්තශාලා සහ එහි භූමි ලියාපදිංචි කිරීම, නැවත ලියාපදිංචිය හෝ ඒ සඳහා අනුමතය ලබා ගැනීම, කර්මාන්තශාලා විශාල කිරීම, වෙනස් කිරීම, වෙනත් ගොඩනැගිලි කර්මාන්තශාලා ගොඩනැගිලි බවට පරිවර්තනය කිරීම, කර්මාන්තශාලාවක ලියාපදිංචි සහතිකය අලුත් කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රය**

ලියාපදිංචි කිරීම සඳහා වන කර්මාන්තශාලාවේ තොරතුරු :-

| | | |
|---|---|---|
| 1. | කර්මාන්තශාලාවේ නම සහ ලිපිනය :<br><br>දුරකථන අංකය/අංක :<br><br>විද්‍යුත් තැපෑල : | <br><br>ෆැක්ස් : |
| 2. | අයිතිකරුගේ/පදිංචිකරුගේ නම සහ ලිපිනය :<br><br>ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකපත් අංකය/සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය සහ දිනය :<br><br>දුරකථන අංකය :<br><br>විද්‍යුත් තැපෑල : | <br><br><br><br>ෆැක්ස් : |

3. කර්මාන්තශාලාවේ පිහිටුවීම :

පාර්ලිමේන්තු ඡන්ද කොට්ඨාසය :

පරිපාලන දිස්ත්‍රික්කය :

පළාත් පාලන ආයතන බල ප්‍රදේශය :

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය/ග්‍රාම සේවා වසම :

පොලිස් වසම :

4. ඉල්ලුම් පත්‍රය, කර්මාන්තශාලාවක් සහ එහි භූමිභාගයක් ලියාපදිංචි කිරීම, නැවත ලියාපදිංචි කිරීම හෝ ඒ සඳහා අනුමතය ලබා ගැනීම, කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් විශාල කිරීම හෝ වෙනත් ගොඩනැගිලි කර්මාන්තශාලා ගොඩනැගිලි බවට පරිවර්තනය කිරීම, කර්මාන්තශාලාවක සහතිකය අලුත් කිරීම සඳහා ද යන්න.

5. ඉදිරිපත් කරන ලද ලේඛනවල විස්තර :

(i) කර්මාන්ත භූමියේ පිඹුරුපත

(ii) ගොඩනැගිලි සැලැස්ම

(iii) නිෂ්පාදන සැලසුම්

(iv) කර්මාන්තශාලාවට පිවිසුම් මාර්ගය දක්වන දළ සටහන

(v) හිමිකාරත්වය හෝ බදු ගිවිසුමට අදාළ ලේඛන

(vi) වෙනත් යම් ලේඛන

6. කර්මාන්තශාලාවේ කරනු ලබන වැඩවල ස්වභාවය :

අමුද්‍රව්‍ය, නිෂ්පාදන සහ වැඩවල ස්වභාවය ඇතුළුව ක්‍රියාපටිපාටිය සම්බන්ධ වගුව දක්වමින්

7. සවිකර ඇති හෝ සවිකිරීමට නියමිත යන්ත්‍ර සූත්‍ර විස්තර :

8. කර්මාන්තශාලාවේ භාවිත කරනු ලබන බලශක්තිවල වර්ගය :

(නිද. : වාෂ්ප, ඉන්ධන - තෙල්, ගෑස්, ජලය හෝ විදුලිබලය)
පාවිච්චි කරනු ලබන සමස්ථ (අශ්වබල හෝ කි. වො.) :

9. කර්මාන්තශාලාවේ සේවයේ නියුක්ත හෝ සේවයේ නියුක්ත කිරීමට අදහස් කරන තැනැත්තන් උපරිම ගණන

පිරිමි :
ගැහැණු :
තරුණ තැනැත්තන් :
(වයස අවුරුදු 14 සිට 18 දක්වා)

10. කර්මාන්තශාලාවේ වැඩ කරන වේලාවන් (වැඩමුර අනුව ද යන්න)

11. කර්මාන්තශාලාවේ වැඩ ආරම්භ කරන හෝ ආරම්භ කිරීමට අදහස් කරන දිනය :

අයිතිකරුගේ/පදිංචිකරුගේ
අත්සන සහ නිල මුද්‍රාව

දිනය .............................

## II වන උපලේඛනය

(3 වන නියෝගය)

### "අ" වගුව

*කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු*

| *සේවක සංඛ්‍යාව* | *කර්මාන්තශාලාවක් ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු* | *කර්මාන්තශාලාවක් නැවත ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු* |
|---|---|---|
| 1-25 | රු. 1,000 | රු. 1,000 |
| 26 - 125 | රු. 3,000 | රු. 3,000 |
| 126 - 500 | රු. 5,000 | රු. 5,000 |
| 500 ට වැඩි | රු. 10,000 | රු. 10,000 |

### "ආ" වගුව

කර්මාන්තශාලා ගොඩනැගිලි සහ භූමිභාග සඳහා අනුමතය ලබාදීමේ ගාස්තු, කර්මාන්තශාලා ගොඩනැගිලි විශාල කිරීම සඳහා අනුමතය ලබා දීමේ ගාස්තු සහ වෙනත් ගොඩනැගිලි කර්මාන්තශාලා ගොඩනැගිලි බවට පරිවර්තනය කිරීමේ ගාස්තු

| *කර්මාන්තශාලාවේ බිම් ප්‍රමාණය (වර්ග මීටර්)* | *කර්මාන්තශාලා ගොඩනැගිලි සහ භූමි භාග සඳහා අනුමතය ලබාදීමේ ගාස්තු, කර්මාන්තශාලා ගොඩනැගිලි විශාල කිරීම සඳහා අනුමැතිය ලබා දීමේ ගාස්තු සහ වෙනත් ගොඩනැගිලි කර්මාන්තශාලා ගොඩනැගිලි බවට පරිවර්තනය කිරීමේ ගාස්තු* |
|---|---|
| 100 දක්වා | රු. 1,000 |
| 101 - 200 | රු. 2,000 |
| 201 - 300 | රු. 3,000 |
| 301 - 500 | රු. 5,000 |
| 500 ට වැඩි | රු. 10,000 |

III වන උපලේඛනය

(4 වන නියෝගය)

## කර්මාන්තශාලා ආඥාපනත යටතේ

## ලියාපදිංචි කිරීමේ සහතිකය

ලියාපදිංචි අංකය/නැවත ලියාපදිංචි කිරීමේ අංකය :

1. කර්මාන්තශාලාවේ නම සහ ලිපිනය :

   ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ අංකය/සමාගම් ලියාපදිංචි අංකය සහ දිනය :

   දුරකථන අංකය :

2. අයිතිකරු/පදිංචිකරු/ ගේ නම සහ ලිපිනය :

   දුරකථන අංකය :

3. කර්මාන්තශාලාවේ පිහිටීම :

   පළාත :
   දිස්ත්‍රික්කය :
   නගරය හෝ ගම :
   ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :
   ඡන්ද කොට්ඨාසය :

4. කර්මාන්තශාලාවේ කරනු ලබන වැඩවල ස්වභාවය :

5. සේවයේ නියුක්ත උපරිම තැනැත්තන් ගණන

   පිරිමි :
   ගැහැණු :
   තරුණ තැනැත්තන් :
   (වයස අවුරුදු 14 සිට 18 දක්වා)

6. සහතිකය වලංගු කාලසීමාව :

   නිකුත් කළ දිනය :
   කල් ඉකුත් වන දිනය :

මෙම ලියාපදිංචි කිරීමේ සහතිකය, (128 වන අධිකාරිය වූ) කර්මාන්තශාලා ආඥාපනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝගවල විධිවිධානවලට යටත්ව නිකුත් කරනු ලැබේ.

ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු/
දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු
මුද්‍රාව

දිනය .............................

පූර්වෝක්ත කරුණු පිළිබඳ කිසියම් වෙනස් වීමක් සිදුවුවහොත් නියමිත ඉල්ලුම් පත්‍රයෙන් ඒ බව මසක් ඇතුළත දැනුම් දිය යුතු ය. මෙම සහතිකයෙහි කිසිදු වෙනසක් කිරීම වරදකි.

10 - 491/1

එල්.ඩී.බී. 17/2014

## (128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනත

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් (128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනතේ 34 වන වගන්තිය සමග කියවිය යුතු, එකී ආඥාපනතේ 105 වන වගන්තිය යටතේ සාදනු ලැබ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝග.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 2019 අංක 2 දරන කර්මාන්තශාලා (හුමාල බොයිලේරු ලියාපදිංචි කිරීමේ) නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. කිසිම කර්මාන්තශාලාවක අයිතිකරුවකු හෝ පදිංචිකරුවෙකු විසින්, හුමාල බොයිලේරු සම්බන්ධයෙන් ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබ ඇත්නම් මිස කර්මාන්තශාලාවේ එම හුමාල බොයිලේරු පාවිච්චි කිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

එසේ වුව ද, මෙම නියෝග ක්‍රියාත්මක වන දිනයේ දී කර්මාන්ත ශාලාවක පාවිච්චි කරමින් පවතින යම් හුමාල බොයිලේරුවක්, මෙම නියෝග ක්‍රියාත්මක වන දින සිට මාස හයක කාලසීමාවක් ඇතුළත මෙම නියෝග යටතේ ලියාපදිංචි කළ යුතු ය.

3. (128 වන අධිකාරිය වූ) කර්මාන්තශාලා ආඥාපනතෙන් නියම කොට ඇති පරිදි හුමාල බොයිලේරුව ලියාපදිංචි කිරීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ද සමග ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

4. 3 වන නියෝගය යටතේ ඉල්ලුම්පත්‍රයක් ලැබුණු විට, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින් එම හුමාල බොයිලේරුව පරීක්ෂා කිරීමෙන් අනතුරුව, එම හුමාල බොයිලේරුව හොඳ තත්ත්වයක පවතින බවට ඔහු සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින්, මෙහි III වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතු ය.

5. (1) යම් හුමාල බොයිලේරුවක හිමිකම වෙනත් තැනැත්තෙකුට මාරු කරනු ලබන අවස්ථාවක, එම හුමාල බොයිලේරුවේ හිමිකම මාරු කිරීම පිළිබඳව සහ එහි අලුත් අයිතිකරු ගේ විස්තර ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයාට හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා හට වහාම දැනුම් දීම එහි අලුත් අයිතිකරුගේ වගකීම වන්නේ ය.

(2) යම් හුමාල බොයිලේරුවක් ලියාපදිංචි කිරීමට අදාළ වන්නා වූ ඉහත විධිවිධාන එම හුමාල බොයිලේරුවේ අලුත් අයිතිකරුට ද අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

6. ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා හැර වෙනත් කිසිම තැනැත්තෙකුට ලියාපදිංචි සහතිකයේ දක්වා ඇති යම් සටහනකට යම් එකතු කිරීමක්, ඉවත් කිරීමක්, සංශෝධනය කිරීමක් හෝ වෙනස් කිරීමක් කිරීම සඳහා අධිකාරයක් නොමැති විය යුතු ය.

7. කර්මාන්තශාලාවක අයිතිකරු හෝ පදිංචිකරු විසින් පහත දැක්වෙන තොරතුරු හුමාල බොයිලේරුවේ පැහැදිලිව පෙනෙන ලෙස මුද්‍රා තැබීමට සැලැස්විය යුතු ය :-

(අ) එම හුමාල බොයිලේරුවේ නිෂ්පාදකයාගේ නම සහ අංකය ;
(ආ) බොයිලේරුවේ මාදිලිය සහ අනුක්‍රමික අංකය ;
(ඇ) නිෂ්පාදන වර්ෂය ;
(ඈ) හුමාල ධාරිතාවය පැයට රාත්තල් හෝ කි. ග්‍රෑ. වලින් ;
(ඉ) ඉඩ දිය හැකි උපරිම වැඩ කිරීමේ පීඩනය වර්ග අඟලකට රාත්තල් හෝ වර්ග සෙ. මීටරයට කි.ග්‍රෑ. වලින්.

8. හුමාල බොයිලේරුවක අයිතිකරු හෝ පදිංචිකරු විසින්, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා හෝ ඔහු විසින්, ඒ සඳහා බලය පවරා ඇති වෙනත් යම් නිලධරයෙකු විසින් නියම කරනු ලබන අවස්ථාවක එම හුමාල බොයිලේරුවේ නිෂ්පාදකයා විසින් පාවිච්චි කළ යම් කාර්මික පිරිවිතර පෙන්නුම් කරන නිෂ්පාදකවරයාගේ සහතිකය සහ වෙනත් වාර්තා, මෝස්තර සහ මිණුම් සහ පරීක්ෂණ වාර්තා තමා භාරයේ තබාගත යුතු අතර, බොයිලේරුවේ සවිකොට ඇති මුද්‍රාවට අනුකූලව පරීක්ෂා කිරීම සඳහා ලබා දිය යුතු වන්නේ ය.

9. (1) මේ නියෝගවල 4 වන නියෝගය යටතේ නිකුත් කරනු ලබන යම් ලියාපදිංචි කිරීමේ සහතිකයක්, එම ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු ලබන දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා වලංගු විය යුතු ය.

(2) එවැනි ලියාපදිංචි කිරීමේ සහතිකයක් අලුත් කිරීම සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක් ම, පවතින ලියාපදිංචි කිරීමේ සහතිකය කල් ඉකුත් වීමට මාස තුනකට පෙරාතුව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ද සමග මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන ඡේදය යටතේ අලුත් කිරීම සඳහා වන ඉල්ලුම්පත්‍රයක් ලැබුනු විට, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින් එම හුමාල බොයිලේරුව පරීක්ෂා කිරීමෙන් අනතුරුව, එම හුමාල බොයිලේරුව හොඳ තත්ත්වයේ පවතින බවට සෑහීමට පත් වේ නම්, ඔහු විසින් ලියාපදිංචි කිරීමේ සහතිකය අලුත් කරනු ලැබිය යුතු ය.

10. සෑම කර්මාන්තශාලාවකම අයිතිකරු හෝ පදිංචිකරු විසින් මෙහි IV වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව වූ ''නඩත්තු වාර්තා පොත'' යනුවෙන් හඳුන්වනු ලබන වාර්තා පොතක් පවත්වාගෙන යෑමට සැලැස්විය යුතු ය.

11. යම් හුමාල බොයිලේරුවකට අදාළ ලියාපදිංචි කිරීමේ සහතිකය සහ නඩත්තු වාර්තා පොත එම හුමාල බොයිලේරුව පාවිච්චි කරනු ලබන පරිශ්‍රයේ තැබිය යුතු අතර, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පරීක්ෂා කිරීම සඳහා අප්‍රමාදව ලබා ගත හැකි වන සේ තැබිය යුතු ය.

12. මෙම නියෝගවල විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරුවකු වන්නේ ය.

## I වන උපලේඛනය

(3, 5 සහ 9 වන නියෝග)

### හුමාල බොයිලේරු ලියාපදිංචි කිරීම, පැවරීමේ දී ලියාපදිංචි කිරීම, ලියාපදිංචි කිරීමේ සහතික අලුත් කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය

1. අයිතිකරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය -
2. කර්මාන්තශාලා පදිංචිකරුගේ නම සහ ලිපිනය -
3. හුමාල බොයිලේරුව සවිකොට ඇති පරිශ්‍රයේ නම සහ ලිපිනය -
4. ඉල්ලුම්පත්‍රය පහත සඳහන් කවරක් සඳහා ද යන බව -
    (අ) හුමාල බොයිලේරු ලියාපදිංචිය සඳහා ;
    (ආ) පැවරුමක දී හුමාල බොයිලේරුව නැවත ලියාපදිංචි කිරීම සඳහා ; හෝ
    (ඇ) හුමාල බොයිලේරුවේ ලියාපදිංචි සහතිකය අලුත් කිරීම සඳහා
5. හුමාල බොයිලේරුව මිල දී ගත් දිනය සහ එය මිල දී ගත් තැනැත්තාගේ නම -

    හුමාල බොයිලේරුවේ යම් කලින් අයිතිකරුවෙකු සිටී නම් ඔහුගේ නම -

    (අ) හුමාල බොයිලේරුව අලුත් එකක් ද, පාවිච්චි කළ එකක් ද යන බව -
    (ආ) හුමාල බොයිලේරුව පළමුව ක්‍රියාත්මක කළ දිනය සහ එය සවිකළ ස්ථානය (දන්නේ නම්) -
    (ඇ) වර්තමාන පරිශ්‍රයේ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට අදහස් කරන දිනය -
6. හුමාලය උත්පාදනය කරනු ලබන කාරණය -
7. නිෂ්පාදකයාගේ නම -
8. නිෂ්පාදන කේතය -
9. නිෂ්පාදන වර්ෂය -

10. හුමාල බොයිලේරුවේ වර්ගය (නිද. ජල නල, ගිනි නල ආදී වශයෙන්)

11. හුමාල ධාරිතාවය (පැයට) -

12. නිෂ්පාදකයාගේ පරීක්ෂක පීඩනය සහ පරීක්ෂණයේ ස්වභාවය (යම් තොරතුරු වේ නම් අමුණන්න)

13. ඉඩ දිය හැකි උපරිම වැඩ කරන පීඩනය -

14. ඉදිකිරීම් ස්වභාවය (නිද. වෙල්ඩ් කරන ලද, රිවට් කරන ලද යනාදී වශයෙන්) -

15. භාවිතා කරනු ලබන ඉන්ධන වර්ගය -

16. බොයිලේරුව සවිකරන ස්ථානය (සටහන් අමුණන්න)

17. වෙනත් යම් තොරතුරු -

.................................................. වන මා විසින්, ඉදිරිපත් කරන ලද තොරතුරු මගේ දැනුම සහ විශ්වාසය අනුව සත්‍ය සහ නිවැරදි බවට මෙයින් සහතික කරමි.

දිනය - අයිතිකරුගේ/පදිංචිකරුගේ අත්සන.

---

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

1. ඉල්ලුම්පත්‍ර අංකය -
2. ඉල්ලුම් පත්‍රය ලැබුණු දිනය -
3. අයකරන ලද ඉල්ලුම්පත්‍ර ගාස්තුව -
4. දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු/කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ නිර්දේශය -
5. ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු විසින් පවරන ලද ලියාපදිංචි අංකය -

ඉහත ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලුම්පත්‍රය අනුමත කරන ලදී/අනුමත නොකරන ලදී.
(අනුමත නොකරන ලද්දේ නම් ඒ සඳහා හේතු දක්වන්න).

6. වලංගු කාලය ................ සිට .................. දක්වා

ප්‍රධාන කර්මාන්තශාලා/දිස්ත්‍රික් කර්මාන්තශාලා
පරීක්ෂක ඉංජිනේරු පරීක්ෂක ඉංජිනේරු
මුද්‍රාව

දිනය - ...........................................

අනුමත නොකිරීමට හේතු

ප්‍රධාන කර්මාන්තශාලා/දිස්ත්‍රික් කර්මාන්තශාලා
පරීක්ෂක ඉංජිනේරු පරීක්ෂක ඉංජිනේරු
මුද්‍රාව

දිනය - ..........................................

## II වන උපලේඛනය

(3 වන නියෝගය)

**හුමාල බොයිලේරු ලියාපදිංචි කිරීමේ ගාස්තු**

| කාණ්ඩය | බොයිලේරුවේ හුමාල ධාරිතාවය (කි.ග්‍රෑ/පැය වලින්) | අලුත් බොයිලේරුවේ ලියාපදිංචි ගාස්තු | බොයිලේරුවේ ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු | පවරන ලද බොයිලේරුවක ලියාපදිංචි ගාස්තු |
|---|---|---|---|---|
| 3 | 1000 දක්වා | රු. 3000 | රු. 1500 | රු. 2000 |
| 2 | 1000 සිට 3000 දක්වා | රු. 5000 | රු. 3000 | රු. 4000 |
| 1 | 3000 ට වැඩි | රු. 7000 | රු. 6000 | රු. 5000 |

## III වන උපලේඛනය

(4 වන නියෝගය)

**ලියාපදිංචි කිරීමේ සහතිකය**

පොත් අංකය -

ශ්‍රී ලංකා ආණ්ඩුව
බොයිලේරු ලියාපදිංචි කිරීමේ සහතිකය
කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

(1 වන පිටුව)

I වන කොටස - සාමාන්‍ය

1. ලියාපදිංචි අංකය :-
2. වර්ගය හෝ නිෂ්පාදකගේ නම :-
3. නිෂ්පාදිත අංකය :-
4. නිෂ්පාදන වර්ෂය :-
5. වර්ගය සහ දළ පරිමාණය :-
6. හුමාල ධාරිතාව (පැයට) :-
7. ඉඩ දිය හැකි උපරිම වැඩ පීඩනය :-
8. ඉන්ධන වර්ගය :-
9. (අ) නිෂ්පාදකගේ පරීක්ෂක පීඩනය :-
   (ආ) ඉදිකර ඇති ද්‍රව්‍ය :-
   (ඇ) නිෂ්පාදකගේ කේතය :-

(2 වන පිටුව)

II වන කොටස - හිමිකම

1. අයිතිකරු/පදිංචිකරුගේ සම්පූර්ණ නම :-
2. අයිතිකරු/පදිංචිකරුගේ ලිපිනය :-
3. බොයිලේරුව සවිකොට ඇති පරිශ්‍රයේ ලිපිනය :-
4. බොයිලේරුව පාවිච්චි කරන්නාගේ නම සහ ලිපිනය :-
5. ඉඩදිය හැකි උපරිම වැඩ පීඩනය
   (අවසන් පරීක්ෂණ වාර්තාවට අනුව)

පදිංචිකරුගේ අත්සන

ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු/දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ අත්සන මුද්‍රාව :-

දිනය :-

දිනය :-

10. සටහන :- 2 - 9 දක්වා අයිතම අයිතිකරු/පදිංචිකරුගේ ඉල්ලුම්පත්‍රයේ තොරතුරු අනුව වේ. ඉහත භූමාල බොයිලේරුව ලියාපදිංචි කිරීම හෝ පැවරීමක දී නැවත ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචි සහතිකය අලුත් කිරීම .................... සිට ...................... දක්වා මෙයින් අනුමත කරමි.

දිනය :- ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු/ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ අත්සන මුද්‍රාව

දිනය :-

(3 වන පිටුව)

II වන කොටස - හිමිකම

දෙවන පැවරීම

1. අයිතිකරු/පදිංචිකරු (පැවරුම්ලාභිගේ) සම්පූර්ණ නම -
2. අයිතිකරු/පදිංචිකරු (පැවරුම්ලාභිගේ) ලිපිනය -
3. බොයිලේරුව සවිකොට ඇති පරිශ්‍රයේ ලිපිනය -
4. බොයිලේරුව පාවිච්චි කරන්නාගේ නම සහ ලිපිනය -
5. ඉඩදිය හැකි උපරිම වැඩ පීඩනය
(අවසන් පරීක්ෂණ වාර්තාවට අනුව)

| | |
|---|---|
| අයිතිකරුගේ/ පදිංචිකරුගේ අත්සන | ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ අත්සන මුද්‍රාව |
| දිනය | දිනය |

තුන්වන පැවරීම

1. අයිතිකරු/පදිංචිකරු (පැවරුම්ලාභීගේ) සම්පූර්ණ නම -
2. අයිතිකරු/පදිංචිකරු (පැවරුම්ලාභිගේ) ලිපිනය -
3. බොයිලේරුව සවිකොට ඇති පරිශ්‍රයේ ලිපිනය -
4. බොයිලේරුව පාවිච්චි කරන්නාගේ නම සහ ලිපිනය -
5. ඉඩදිය හැකි උපරිම වැඩ පීඩනය
(අවසන් පරීක්ෂණ වාර්තාවට අනුව)

| | |
|---|---|
| අයිතිකරුගේ/ පදිංචිකරුගේ අත්සන | ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ/ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ අත්සන මුද්‍රාව |
| දිනය | දිනය |

පළමු පැවරීම

1. අයිතිකරු/පදිංචිකරු (පැවරුම්ලාභීගේ) සම්පූර්ණ නම :-
2. අයිතිකරු/පදිංචිකරු (පැවරුම්ලාභීගේ) ලිපිනය :-
3. බොයිලේරුව සවිකොට ඇති පරිශ්‍රයේ ලිපිනය :-
4. බොයිලේරුව පාවිච්චි කරන්නාගේ නම සහ ලිපිනය :-
5. ඉඩදිය හැකි උපරිම වැඩ පීඩනය
(අවසන් පරීක්ෂණ වාර්තාවට අනුව)

| | |
|---|---|
| පදිංචිකරුගේ අත්සන | ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු/ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ අත්සන මුද්‍රාව |
| දිනය :- | දිනය : |

(4 වන පිටුව)

II වන කොටස - හිමිකම

හතරවන පැවරීම

1. අයිතිකරු/පදිංචිකරු (පැවරුම්ලාභීගේ) සම්පූර්ණ නම -
2. අයිතිකරු/පදිංචිකරු (පැවරුම්ලාභීගේ) ලිපිනය -
3. බොයිලේරුව සවිකොට ඇති පරිශ්‍රයේ ලිපිනය -
4. බොයිලේරුව පාවිච්චි කරන්නාගේ නම සහ ලිපිනය -
5. ඉඩදිය හැකි උපරිම පිඩනය
(අවසන් පරීක්ෂණ වාර්තාවට අනුව)

| | |
|---|---|
| අයිතිකරුගේ/ පදිංචිකරුගේ අත්සන | ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ අත්සන මුද්‍රාව |
| දිනය | දිනය |

පස්වන පැවරීම

1. අයිතිකරු/පදිංචිකරු (පැවරුම්ලාභීගේ) සම්පූර්ණ නම -
2. අයිතිකරු/පදිංචිකරු (පැවරුම්ලාභීගේ) ලිපිනය -
3. බොයිලේරුව සවිකොට ඇති පරිශ්‍රයේ ලිපිනය -
4. බොයිලේරුව පාවිච්චි කරන්නාගේ නම සහ ලිපිනය -
5. ඉඩදිය හැකි උපරිම වැඩ පිඩනය
(අවසන් පරීක්ෂණ වාර්තාවට අනුව)

| | |
|---|---|
| අයිතිකරුගේ/ පදිංචිකරුගේ අත්සන | ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු/ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ අත්සන මුද්‍රාව |
| දිනය | දිනය |

IV වන උපලේඛනය

(10 වන නියෝගය)

**හුමාල බොයිලේරු නඩත්තු වාර්තා පොත**

1. නිෂ්පාදකයාගේ නම -
2. නිෂ්පාදන ක්ෂේත්‍රය -
3. නිෂ්පාදන වර්ෂය -
4. හුමාල බොයිලේරුවේ වර්ගය (නිද. ජල නල, ගිනි නල ආදී වශයෙන්) -
5. හුමාල ධාරිතාවය (පැයට) -
6. නිෂ්පාදකයාගේ පරීක්ෂක පීඩනය සහ පරීක්ෂණයේ ස්වභාවය (යම් තොරතුරු වේ නම් අමුණන්න)
7. ඉඩ දිය හැකි උපරිම වැඩ කරන පීඩනය -
8. භාවිතා කරනු ලබන ඉන්ධන වර්ගය -
9. අදාළ අනෙක් තොරතුරු -

| *අභ්‍යන්තර සහ බාහිර පරීක්ෂණ දින පරීක්ෂණ/පවිත්‍ර කිරීම සහ අලුත්වැඩියා කිරීම්* | | *පරීක්ෂණ වර්ග අභ්‍යන්තර සහ බාහිර පරීක්ෂණ/ පවිත්‍ර කිරීම සහ අලුත්වැඩියා කිරීම්* | *බලයලත් නිලධරයා/ නිලධාරීන්ගේ නම* | *බොයිලේරු පරිචාරකගේ නම/III, II, I වන කාණ්ඩය* | *හුමාල බොයිලේරුව පාවිච්චි නොකරන ලද කාලසීමාව - (එම කාලය මාස පහකට වැඩි නම් හේතු දක්වන්න)* | *පදිංචිකරු විසින් බලය පැවරීම* |
|---|---|---|---|---|---|---|
| *ආරම්භක දිනය* | *සම්පූර්ණ කළ දිනය* | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

10 - 491/2

---

එල්.ඩී.බී. 17/2014

**(128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනත**

(128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනතේ 34, 35, 36, 36අ, 38 සහ 38අ වන වගන්ති සමග කියවිය යුතු, එහි 105 වන වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදනු ලැබ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝග.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍ය.

2019 මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2019 අංක 3 දරන කර්මාන්තශාලා (හුමාල බොයිලේරු සහ අනෙකුත් පීඩන භාජන පරීක්ෂා කිරීම සඳහා සහතික නිකුත් කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සතු යම් තැනැත්තෙකු (128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනතේ නියම කොට ඇති පරිදි යම් හුමාල බොයිලේරු හෝ වෙනත් යම් පීඩන භාජන පරීක්ෂා කිරීම සඳහා සහතිකයක් (මෙම නියෝගවල මින්පසු ''සහතිකය'' යනුවෙන් හඳුන්වනු ලබන) සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන්නේ ය.

(2) යම් හුමාල බොයිලේරුවක් හෝ වෙනත් යම් පීඩන භාජනයක් පරීක්ෂා කිරීම සඳහා දැනටමත් සහතිකයක් නිකුත් කොට ඇති යම් තැනැත්තෙකු විසින්, මෙම නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස හයක් ඇතුළත මෙම නියෝග යටතේ අලුත් සහතිකයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කළ යුතු ය. මෙම නියෝග ක්‍රියාත්මක වීමට පෙර නිකුත් කරනු ලැබූ යම් සහතිකයක් මෙම නියෝග ක්‍රියාත්මක වන දින සිට මාස හයක කාලසීමාව අවසානයේ අවලංගු වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

3. සහතිකයක් නිකුත් කිරීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම මෙහි III වන උපලේඛනයේ නිශ්චිත දක්වා ඇති ගාස්තුව ද සමග II වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට අනුව ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

4. 3 වන නියෝගය යටතේ ඉල්ලුම්පත්‍රයක් ලැබුණු විට, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින්, කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන් එම ඉල්ලුම්කරු සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවිය යුතු අතර, ඔහු එම ඉල්ලුම්කරුගේ සුදුසුකම් සහ පළපුරුද්ද සම්බන්ධයෙන් සෑහීමට පත් වේ නම්, එම ඉල්ලුම්කරුට මෙහි IV වන උපලේඛනයේ ආකෘතියට සාරානුකූලව වූ සහතිකයක් නිකුත් කළ හැකිය.

5. (1) 4 වන නියෝගය යටතේ නිකුත් කරනු ලබන යම් සහතිකයක්, එම සහතිකය නිකුත් කළ දින සිට අවුරුදු තුනක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු අතර, එම සහතිකය කල් ඉකුත් වීමට මාස එකකට පෙරාතුව එම සහතිකය දරන්නා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍රයක් මගින්, එම සහතිකයේ කල් ඉකුත් වන දිනයේ සිට තවත් අවුරුදු තුනක කාලසීමාවක් සඳහා අලුත් කළ හැකි ය.

(2) මෙම නියෝග යටතේ සහතිකයක් සඳහා වන ඉල්ලුම්පත්‍රයට අදාළ වන ඉහතින් වූ විධිවිධාන, එම සහතිකය අලුත් කිරීමේ ඉල්ලුම්පත්‍රයක් සඳහා ද, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ වන්නේ ය.

6. සහතිකයක් දරන්නකු විසින්, එම සහතිකය අදාළ වන්නේ යම් වර්ගයක පීඩන භාජනයක් සඳහා ද, එම වර්ගය හැර වෙනත් යම් වර්ගයක පීඩන භාජනයක් සඳහා ද සිය සහතිකය දීර්ඝ කර ගැනීම සඳහා ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ හැකි ය.

7. (1) ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා සහතිකයක් නිකුත් කිරීම හෝ එවැනි සහතිකයක් අලුත් කිරීම හෝ මේ නියෝග යටතේ එවැනි සහතිකයක් දීර්ඝ කිරීම ප්‍රතික්ෂේප කරන යම් අවස්ථාවක, එම තීරණයේ සිට මාසයක් ඇතුළත එම ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු ද සමග ලිඛිතව එම තීරණය ඉල්ලුම්කරුට සන්නිවේදනය කළ යුතු ය.

(2) ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින්, සහතිකයක් නිකුත් කිරීම හෝ එවැනි සහතිකයක් අලුත් කිරීම හෝ මේ නියෝග යටතේ එවැනි සහතිකයක් දීර්ඝ කිරීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක එම ප්‍රතික්ෂේප කිරීමේ දින සිට මාස දොළහක් ඉකුත් වන තෙක් සහතිකයක් නිකුත් කිරීම, අලුත් කිරීම හෝ දීර්ඝ කිරීම සඳහා ඉල්ලුම් කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.

8. (128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනතේ 34 වන වගන්තියේ (12) වන උපවගන්තිය යටතේ සහතිකයක් දරන්නෙකුට එරෙහිව නඩු කටයුතු පවත්වාගෙන යනු ලබන අවස්ථාවක හෝ ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින් මෙම ආඥාපනතේ 34 වන වගන්තියේ (13) වන උපවගන්තිය යටතේ සහතිකයක් දරන්නෙකුට නැවත පරීක්ෂා කිරීමක් නියම කොට ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, එම නඩු කටයුතු හෝ නැවත පරීක්ෂා කිරීම සම්පූර්ණ වන තෙක් එම තැනැත්තාට නිකුත් කරන ලද සහතිකය තාවකාලිකව අත්හිට වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

9. යම් සහතිකයක් දරන්නෙකු (128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනත යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, එම තැනැත්තාට මෙම නියෝග යටතේ නිකුත් කරන ලද සහතිකයක්, එම වරදකරු කරනු ලැබූ දින සිට බලාත්මක වන පරිදි අවලංගු වූ ලෙස සලකනු ලැබිය යුතු ය. එවැනි තැනැත්තෙකු, එම අවලංගු වීමේ දින සිට අවුරුදු හතක කාලසීමාවක් ඉකුත් වන තෙක් අලුතින් සහතිකයක් ලබා ගැනීම සඳහා මෙම නියෝග යටතේ ඉල්ලීමක් කිරීම සඳහා හිමිකම් නොලබන්නේ ය.

10. යම් සහතිකයක් දරන තැනැත්තෙකු පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම සඳහා අදාළ පෝරම පිටපත් තුනකින් යුක්තව කම්කරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතු අතර එම සහතික නිකුත්කොට මාසයක් ඇතුළත කම්කරු දෙපාර්තමේන්තුවට අදාළ පිටපත ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයාට හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා වෙත එවිය යුතු ය.

11. මෙම නියෝගවල විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙකු (128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම නියෝගවල කාර්යය සඳහා,

''ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා'' යන්නෙන්, (128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

''වෙනත් යම් පීඩන භාජන'' යන්නෙන්, (128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනතේ 35, 36, 36අ සහ 38 යන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති යම් පීඩන භාජනයක් ඇතුළත් වේ ;

''හුමාල බොයිලේරුව'' යන්නෙන්, (128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

## I වන උපලේඛනය

(3 වන නියෝගය)

### හුමාල බොයිලේරු සහ අනෙකුත් පීඩන භාජන පරීක්ෂා කිරීම සඳහා වන සහතිකයක් ලබාගැනීම සඳහා අවශ්‍යතා

1. ඉල්ලුම්කරුගේ වයස් සීමාව අවුරුදු 28 සහ 75 අතර විය යුතු ය.
2. අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුදු අවුරුදු ගණන -

| | අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අවශ්‍ය අවුරුදු ගණන | |
|---|---|---|
| | හුමාල බොයිලේරු සඳහා | අනෙකුත් පීඩන භාජන සඳහා |
| (අ) වෘත්තීයමය සුදුසුකම්ලත් ඉංජිනේරු * | අවුරුදු 2 | අවුරුදු 2 |
| (ආ) යාන්ත්‍රික ඉංජිනේරු උපාධිධරයකු | අවුරුදු 5 | අවුරුදු 3 |
| (ඇ) හුමාල බොයිලේරු සහ අනෙකුත් පීඩන භාජන පරීක්ෂා කිරීම සඳහා වලංගු සහතිකයක් ඇති තැනැත්තන් | අවුරුදු 5 | අවුරුදු 3 |

* වෘත්තීයමය සුදුසුකම්ලත් ඉංජිනේරුවරයා යන්නෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය ඇති යාන්ත්‍රික ඉංජිනේරුවෙකු හෝ යාන්ත්‍රික ඉංජිනේරු (ලන්ඩන්) ආයතනයේ සාමාජිකත්වය ඇති ඉංජිනේරුවෙකු, හෝ 1968 අංක 17 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන පනත යටතේ පිළිගත් වෙනත් ආයතනයක සාමාජිකත්වය ඇති යාන්ත්‍රික ඉංජිනේරුවන් අදහස් වේ.

## II වන උපලේඛනය

(3 වන නියෝගය)

### හුමාල බොයිලේරු සහ වෙනත් පීඩන භාජන පරීක්ෂා කිරීම සඳහා වන සහතිකයක් නිකුත් කිරීම, එම සහතිකය දීර්ඝ කිරීම සහ අලුත් කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය

1. (අ) ඉල්ලුම්කරනු ලබන සහතිකය -
(හුමාල බොයිලේරු සහ වෙනත් පීඩන භාජන/හුමාල ග්‍රාහක/වාත ග්‍රාහක/වායු ග්‍රාහක සහ වායු ධාරක)*

(ආ) ඉල්ලුම්කරනු ලබන්නේ අලුත් සහතිකයක් සඳහා ද, සහතිකයක් අලුත් කිරීම සඳහාද, නැතහොත් සහතිකය වෙනත් පීඩන භාජන වර්ග සඳහා දීර්ඝ කිරීම සඳහා ද යන බව

2. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම -
3. ව්‍යාපාර ස්ථානයේ ලිපිනය සහ දුරකථන අංකය -
4. පුද්ගලික ලිපිනය සහ දුරකථන අංකය -
5. විද්‍යුත් තැපෑල -
6. උපන් දිනය -
7. (අ) ජාතිය -

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය -

8. සාමාන්‍ය කාර්මික අධ්‍යාපනය

(දින වකවානු අනුපිළිවෙලට)

සමත් වූ විභාග අනුරූප දින සමග -

(i)

(ii)

(iii)

(iv)

9. වෘත්තීයමය සුදුසුකම් -

(i)

(ii)

(iii)

10. ඉල්ලුම්කරු සේවයේ නියුක්ත නම්, සේවා ස්ථානයේ ඔහුගේ තනතුර -

11. (අ) සහතිකය ඉල්ලුම්කර ඇති විශේෂිත ක්ෂේත්‍රයේ පුහුණුව -

විස්තර දක්වන්න

(ආ) පුහුණුව ලබා ඇති බලයලත් නිලධරයා හෝ අධිකාරියේ නම සහ ලිපිනය -

12. සහතිකය ඉල්ලුම්කර ඇති ක්ෂේත්‍රයේ පළපුරුද්ද -

13. ඉල්ලුම්කරු, ප්‍රධාන කර්මාන්තශාලා ඉංජිනේරුවරයා විසින් නිකුත් කරන ලද යම් සහතිකයක් දරන්නේ ද එසේ නම් එම සහතිකයේ අංකය -

14. හුමාල බොයිලේරු සහ අනෙකුත් පීඩන භාජන පරීක්ෂා කිරීම ක්‍රියාත්මක කිරීමේ ප්‍රදේශය -

15. වෙනත් යම් තොරතුරු -

මා මෙහි සඳහන් කළ තොරතුරු සත්‍ය සහ නිවැරදි බව සහතික කරමි. මෙම ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු අසත්‍ය හෝ සාවද්‍ය බව සොයා ගනු ලැබුවහොත්, ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයා විසින් මට නිකුත් කොට ඇති සහතිකය අවලංගු වීමට භාජනය වන බව මා දනිමි.

ඉල්ලුම්කරුගේ අත්සන

දිනය ඃ

* අදාළ නොවන දෑ කපා හරින්න.

**III වන උපලේඛනය**

(3 වන නියෝගය)

හුමාල බොයිලේරු සහ වෙනත් පීඩන භාජන පරීක්ෂා කිරීමේ සහතිකය සඳහා සහ එම සහතිකය අලුත් කිරීම සහ එම සහතිකය දීර්ඝ කිරීමේ ගාස්තු

| | *හුමාල බොයිලේරු සඳහා* | *හුමාල ග්‍රාහක/වාත ග්‍රාහක/ වායු ග්‍රාහක/වායු ධාරක සඳහා (එක් එක් පීඩන භාජන)* |
|---|---|---|
| සහතිකයේ ගාස්තුව | රු. 5000/- | රු. 1000/- |
| සහතිකය අලුත් කිරීමේ ගාස්තුව | රු. 1000/- | රු. 1000/- |
| සහතිකය දීර්ඝ කිරීමේ ගාස්තුව | රු. 4000/- | රු. 1000/- |

**IV වන උපලේඛනය**

(4 වන නියෝගය)

**(128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනත යටතේ හුමාල බොයිලේරු සහ වෙනත් පීඩන භාජන පරීක්ෂා කිරීම සඳහා වන සහතිකය**

සහතික අංකය -

.................................... පදිංචි ............................................. (ජාතික හැඳුනුම්පත් අංකය .....................................) (128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනත යටතේ පහත දැක්වෙන පීඩන භාජන පරීක්ෂා කිරීම සඳහා බලයලත් නිලධරයෙකු ලෙස පත් කරනු ලැබේ.

1. හුමාල බොයිලේරු (කර්මාන්තශාලා ආඥාපනතේ 34 වන වගන්තිය යටතේ)
2. හුමාල ග්‍රාහක (කර්මාන්තශාලා ආඥාපනතේ 35 වන වගන්තිය යටතේ)
3. වාත ග්‍රාහක (කර්මාන්තශාලා ආඥාපනතේ 36 වන වගන්තිය යටතේ)
4. වායු ග්‍රාහක (කර්මාන්තශාලා ආඥාපනතේ 36අ වන වගන්තිය යටතේ)
5. වායු ධාරක (කර්මාන්තශාලා ආඥාපනතේ 38 වන වගන්තිය යටතේ)

මෙම සහතිකය ............................................. දින දක්වා වලංගු වේ.

ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුගේ අත්සන
මුද්‍රාව

දිනය - ....................................

1. අදාළ නොවන දෑ කපා හරින්න.

මෙම සහතිකයෙහි අඩංගු කිසිවකට අනවසර වෙනසක් කිරීම වරදකි.

10 - 491/3

එල්.ඩී.බී. 17/2014

## (128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනත

(128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනතේ 58අ වන වගන්තිය සමග කියවිය යුතු, එකී ආඥාපනතේ 105 වන වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදනු ලැබ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝග.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍ය.

2019 මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 2019 අංක 4 දරන කර්මාන්තශාලා (සේවකයින් අධික ශබ්දයෙන් ආරක්ෂා කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. අනුකලිත ශබ්ද මට්ටම් මීටරයකින් (මන්දවේග ප්‍රතිචාර) මනිනු ලබන 85 dB (A) ශබ්දයේ බලපෑම් මට්ටමකට සමාන හෝ ඊට වැඩි ශබ්දයේ බලපෑම් මට්ටමකට නිරාවරණය වන යම් කර්මාන්තශාලාවක සේවයේ නියුක්ත යම් තැනැත්තෙකුට සුදුසු කන් ආරක්ෂක උපකරණ සපයා දීම එම කර්මාන්තශාලාවේ අයිතිකරු හෝ පදිංචිකරුගේ වගකීම වන අතර කර්මාන්තශාලාවක සේවයේ නියුක්ත යම් තැනැත්තෙකුට ශබ්දයට නිරාවරණය වන කාලසීමාව සහ එම කාලසීමාව තුළ දී එම ශබ්දයට අනුමත ශබ්ද පීඩන මට්ටම මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

එසේ වුවද, මිණුම් කාලපරාසය, සේවා නියුක්තයා විසින් කරනු ලබන ක්‍රියාකාරකම් නියෝජනය වන ආකාරයට ප්‍රමාණවත් පරිදි දීර්ඝ විය යුතු ය. සේවකයන් නිරාවරණය වන ශබ්ද මට්ටම්වල වැදගත් වෙනස්වීම් ඇත්නම්, පැය අටක මනිනු ලබන සාමාන්‍ය ශබ්ද පීඩන මට්ටම ශබ්ද ඩොසිමීටරයක් ආධාරයෙන් මනිනු ලැබිය හැකි ය.

එසේම තවදුරටත්, යම් කර්මාන්තශාලාවක සේවයේ නියුක්ත කිසිම තැනැත්තෙකු කිසිම වේලාවක 140 dB (A) උපරිම ශබ්ද බලපෑම් මට්ටමකට හෝ ඊට වැඩි ශබ්ද බලපෑම් මට්ටමකට හෝ එවැනි ශබ්දයක බලපෑමකට නිරාවරණය නොවිය යුතු ය.

3. කර්මාන්තශාලාවක යම් සේවකයකු මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වූ ශබ්ද බලපෑම් මට්ටමකට ඉක්මවන ශබ්ද බලපෑම් මට්ටමකට භාජනය වන අවස්ථාවක, එම කර්මාන්තශාලාවේ පදිංචිකරු විසින්, එම ශබ්ද බලපෑම් මට්ටම උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වූ අවසර දී ඇති ශබ්ද බලපෑම් මට්ටමේ පවත්වා ගෙන යාම සඳහා පහත දක්වා ඇති පියවර සියල්ල හෝ යම් පියවරක් අනුගමනය කළ යුතු ය :-

(අ) යාන්ත්‍රික පාලනය මඟින් ශබ්ද හටගන්නා මූලාශ්‍රවල ශබ්ද පීඩන මට්ටම අඩු කිරීම සඳහා -

- (i) යන්ත්‍රෝපකරණ හොඳ තත්ත්වයේ පවත්වා ගෙන යෑම, යන්ත්‍ර නිසි පරිදි ස්නේහනය කිරීම සහ යන්ත්‍රවල ගෙවී ගිය හෝ අසමතුලිත කොටස් ආදේශ කිරීම ;
- (ii) යම් කම්පනය වීමක් අඩු කිරීම සඳහා යන්ත්‍රය ප්‍රත්‍යස්ථ රුඳවීමක සවිකිරීම ;
- (iii) යන්ත්‍රෝපකරණ වල ශබ්දය ඇති කොටස්වල යෝග්‍ය සයිලන්සර හෝ නිහඬතර පාවිච්චි කිරීම ;
- (iv) නිශ්ශබ්ද ක්‍රියාවලියකට හුවමාරු වීම ;
- (v) යන්ත්‍රයේ ශබ්දය ධ්වනි කුටියකට සීමා කිරීම ;
- (vi) මෙම යන්ත්‍රෝපකරණවල ක්‍රියාකරුවන් ධ්වනි කුටිවල හුදෙකලා කිරීම ;

(ආ) ශ්‍රවණ ආරක්ෂණය පිළිබඳ වැඩසටහනක් කරගෙන යෑම ;

(ඇ) ප්‍රායෝගික පරිපාලනමය පාලන වැඩසටහනක් අනුගමනය කිරීම ;

4. මෙම නියෝගවල විධිවිධාන කඩකරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන්නේ ය.

5. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම නියෝගවල :-

''ශබ්දය'' යන්නෙන් යාන්ත්‍රිකව, විදුලියෙන් හෝ වෙනත් ඕනෑම අයුරකින් ඇති වන ඝෝෂාවක් ඇතුළත් වේ.

''ප්‍රායෝගික පරිපාලනමය වැඩ සටහන'' යන්නෙන් සේවකයන් ශබ්දයට නිරාවරණය වන කාලසීමාව අඩු කිරීම සඳහා කරනු ලබන වැඩ සටහනක් අදහස් වේ.

''ඩීබී(ඒ)'' යන්නෙන් ශබ්ද පීඩන මට්ටම මැනීමේ ඒකකය අදහස් වේ.

''සමාන ශබ්ද පීඩන මට්ටම'' යන්නෙන් අනුකලිත ශබ්ද මට්ටම් මීටරයකින් මනින ලද දිනක ශබ්ද බලපෑමේ ප්‍රතිඵලය අදහස් වේ ;

''අනුකලිත ශබ්ද මට්ටම් මීටරය'' යන්නෙන් යම් කිසි මිණුම් කාල පරාසයක් තුළ ශබ්ද ශක්තිය එකතු කර එහි සාමාන්‍ය අගය ඩෙසිබල් ඒකකයෙන් ලබා දෙන උපකරණය අදහස් වේ ;

''ශබ්ද ඩොසිමීටරය'' යන්නෙන් තනි සේවකයෙකු සම්බන්ධයෙන් දෙනු ලබන යම් කාලසීමාවක් තුළ දී අවශෝෂණය කරගනු ලබන ශබ්ද බල ප්‍රමාණය අඟවනු ලබන උපකරණයක් අදහස් වන අතර, එම ඩොසිමීටරය පහත දැක්වෙන ප්‍රමිති වලට අනුකූල විය යුතු ය :-

''IEC 61252, ANSI - SI.25'' ;

''සවන් ආරක්ෂණය'' යන්නෙන් අධික ශබ්දයට නිරාවරණය වන සෑම සේවා නියුක්තයෙකුගේ ම ඇසීම සම්බන්ධයෙන් ශ්‍රවණ මිමි පරීක්ෂා සහ වැඩ කරන ප්‍රදේශ වල වාරික ශබ්ද පරීක්ෂා ද ඇතුළුව ඵලදායී සහ දිගටම කරගෙන යනු ලබන ඇසීම සුරක්ෂණය කිරීමේ වැඩ සටහන් මගින් අධික ශබ්දයට නිරාවරණය වන සේවා නියුක්තයෙකු ඇසීම පිරිහීමෙන් ආරක්ෂා කිරීම අදහස් වේ.

''කන්ආරක්ෂක'' යන්නෙන් අවශ්‍ය වන්නා වූ ආකාරයට ශබ්දය හීන වීමක් ලබා ගැනීම සඳහා කන් ඇබ හෝ කන් වැස්ම ඇතුළු ශබ්දයෙන් කන් ආරක්ෂා කිරීම සඳහා වන යම් සුදුසු උපකරණයක් අදහස් වේ.

**උපලේඛනය**

***අවසරලත් උපරිම ශබ්ද පීඩන මට්ටම්***

(රෙගුලාසි 2 සහ 3)

| දිනකට කාල සීමා (පැයවලින්) | සමාන ශබ්ද පීඩන මට්ටම dB (A) Slow/TWA |
|---|---|
| 8 | 85 |
| 4 | 88 |
| 2 | 91 |
| 2 | 94 |
| 1/2 | 97 |
| 1/4 | 100 |

ශබ්ද මට්ටම් මීටර

සියළුම ශබ්ද මට්ටම (ඝෝෂා පීඩන මට්ටම්) පහත සඳහන් වර්ගයේ 1 වන වර්ගයේ හෝ, 2 වන වර්ගයේ අනුකලිත ශබ්ද මට්ටම් මීටරයකින් මැනිය යුතු ය. එනම් IEC-61672-1 (2002-05), IEC_61672-2 (2003-4), BS EN 61252(1997, ANSI 1.25, 1991 (R2002) ANSI 1.4 1983 (R2001) වර්ගයේ මීටර හෝ ක්‍රමාංකන උපකරණ සහිත සමාන ප්‍රමිතියකින් යුත් මීටර වේ.

10 - 491/4

---

එල්.ඩී.බී. 17/2014

**(128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනත**

(128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනතේ 13 වන වගන්තිය යටතේ කියවිය යුතු, එකී ආඥාපනතේ 105 වන වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදනු ලැබ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝග.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍ය.

2019 මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2019 අංක 5 දරන කර්මාන්තශාලා (ආලෝකමත් කිරීමේ පොදු සම්මත) නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. යම් කර්මාන්තශාලාවක කරගෙන යන වැඩවල ස්වභාවය අනුව එම කර්මාන්තශාලාවේ හෝ එහි යම් කොටසක අවශ්‍ය විය හැකි ප්‍රමාණවත් සහ සුදුසු වන්නා වූ ආලෝක සැපයුමක් තහවුරු කිරීම එම කර්මාන්තශාලාවේ අයිතිකරු හෝ පදිංචිකරුගේ වගකීම විය යුතු ය.

3. කර්මාන්තශාලාවේ අයිතිකරු හෝ පදිංචිකරු විසින්, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වැඩ කරනු ලබන ප්‍රදේශවල, එම උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති පරිදි පොළවට මීටර එකක් ඉහළින් වූ නිර්දේශිත මට්ටමේ තිරස් තලයේ මණින ලද ප්‍රදීප්ත මට්ටමක් පවත්වාගෙන යාමට සැලැස්විය යුතු ය.

4. (1) කර්මාන්තශාලාවේ අයිතිකරු හෝ පදිංචිකරු විසින්, වැඩබිම ආලෝකමත් කිරීම සඳහා ඇතුළත සහ පිටත යන පෘෂ්ඨ දෙකම පිරිසිදු සහ ආලෝකය සඳහා බාධාවන්ගෙන් නිදහස් වීදුරු සවිකල ජනේල සහ වහලයේ ඇති වීදුරු කවුළු පාවිච්චි කිරීමට, සැලැස්විය යුතු ය.

(2) මෙම නියෝගයේ සඳහන් කිසිවක් මගින් වැඩබිමේ තාපය, තද ආලෝකය නිසා ඇතිවන දිලිසෙන ස්වභාවය හෝ ඡායාවක් අඩු කිරීමේ කාර්ය සඳහා නැවත අලංකරණය කිරීම/හෝ ජනේල සහ වහලයේ ඇති වීදුරු කවුළු අඳුරු ගැන්වීම සහ වැඩ ස්ථානය වෙනස් කිරීම සම්බන්ධයෙන් බලපෑමක් ඇති නොවිය යුතු ය.

5. (අ) අවශ්‍ය අවස්ථාවල, පුද්ගලික වැඩ ඒකකවල හෝ වැඩ ස්ථානවල සහ විශේෂිත අවදානමක් ඇති අවස්ථාවල ඇස් නිලංකාරවීම, භ්‍රමේක්ෂනය සහ අපහසුතාවක් ඇති කරන ලද ආලෝකය නිසා ඇතිවන දිළිසීම හෝ විදුලි, ගිනි, විකිරණය හෝ ගැටීම් උවදුරු ද ඇතුළු උවදුරු ඇතිවීම වැළැක්වීම සඳහා ;

(ආ) ආලෝක ස්විච සොයා ගැනීම සහ අවදානමකින් තොරව පහසුවෙන් පාවිච්චි කළ හැකි ආකාරයට ආලෝක ස්විච ස්ථාන ගත කිරීම සහතික වීම ;

(ඇ) ඇස්වලට විඩාවක් ඇති කරනු ලබන වැඩබිමේ දිළිසෙන පෘෂ්ඨ ප්‍රතිබිම්බ හෝ ඡායාවන් ඉවත් කළ හැකි ආකාරයට විදුලි බුබුලු අඳුරු ගැන්වීම සහ පිහිටීමට සැලැස්වීම,

කර්මාන්තශාලාවේ අයිතිකරු හෝ පදිංචිකරුගේ වගකීම වන්නේ ය.

6. කර්මාන්තශාලාවේ යම් වැඩබිමක කෘත්‍රිම ආලෝකකරණය නැති වී යන අවස්ථාවක, විශේෂයෙන් එම ස්ථානවල වැඩවල නියුතු තැනැත්තන් සහ අනෙකුත් අය අවදානමට නිරාවරණය වන අවස්ථාවල එම ස්ථානවල සුදුසු සහ ප්‍රමාණවත් හදිසි අවස්ථා ආලෝකකරණය සැපයීම සඳහා කර්මාන්තශාලාවේ අයිතිකරු සහ පදිංචිකරු විසින් පියවර ගත යුතු අතර, එම හදිසි අවස්ථා ආලෝකකරණය සෑම වේලාවකම ක්‍රියාත්මකව පැවතිය යුතු ය. මෙවැනි අවස්ථාවක දී එම ස්ථානවල ලක්ෂ 50 කට වැඩි ප්‍රදීප්ත මට්ටමක් පවත්වා ගත යුතු ය.

7. මෙම නියෝගවල විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන්නේ ය.

8. 1965 දෙසැම්බර් මස 4 වන දින, අංක 14577 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

## උපලේඛනය

(3 වන නියෝගය)

| *I තීරය* | *II තීරය* |
|---|---|
| *වැඩබිම් ප්‍රදේශය* | *ප්‍රදීප්ත මට්ටම* |
| (අ) ගබඩා | ලක්ෂ 100 - 150 |
| (ආ) බර වැඩ හෝ රළු වැඩ (සීමිත දෘෂ්ටි අවශ්‍යතා සහිත වැඩ) | ලක්ෂ 150 - 300 |
| (ඇ) කර්මාන්තශාලවට ඇතුළත්, කාර්ය මණ්ඩලයේ සහ අයකැමිගේ කුටි/කාමර, මුළුතැන්ගෙවල්, පන්ති කාමර, කෑම කාමර, පරිගණක කාමර | ලක්ෂ 300 - 500 |
| (ඈ) කර්මාන්තශාලාවේ එකලස් කිරීමේ පේළිය, ඇඹරුම්, මැසීම්, කැණීම්, ඉනැමල් කිරීම, යන්ත්‍රසූත්‍ර වැඩ (සාමාන්‍ය දෘෂ්ටි අවශ්‍යතා සහිත වැඩ) | ලක්ෂ 500 - 750 |
| (ඉ) සියුම් වැඩ උපකරණ එකලස් කිරීමේ ප්‍රදේශය | ලක්ෂ 750 - 1000 |
| (ඊ) ඉතා සියුම් වැඩ, වර්ණ ගැලපීම, රෙදි පිළි පරීක්ෂාව, ආභරණ එකලස් කිරීම සහ අලුත්වැඩියාව (විශේෂිත දෘෂ්ටි අවශ්‍යතා සහිත වැඩ) | ලක්ෂ 1000 - 2000 |
| (උ) සූක්ෂම ඉලෙක්ට්‍රොනික වැඩ, ඔරලෝසු සෑදීම යනාදිය (දීර්ඝ කාලයක් අවශ්‍ය සියුම් වැඩ) | ලක්ෂ 2000 - 3000 |

10 - 491/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.